අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ - 02/2023(i)

මගේ අංකය : MOJ/E9/පි.ගා.ස./2021
අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.
2023.09.12

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර් අභියාචනාධිකරණය,

**අධිකරණ හා කම්කරු විනිශ්චය සභා මගින් නිකුත් කරනු ලබන පිටපත් ගාස්තු සහ සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේ ගාස්තු**

උක්ත සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.07.10 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 02/2023 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛයෙහි 01, 02, 03 හා 04 වගන්ති සංශෝධනය සම්බන්ධයෙන් පහත පැහැදිලි කිරීම්/ සංශෝධන සහ විධිවිධාන අදාළ කර ගත යුතුය.

01. සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේ ගාස්තු

1.1 ඡායා පිටපත් නිකුත් කිරීමේ යන්ත්‍ර(Photo copy machine) මගින් ලබා ගෙන නිකුත් කරනු ලබන **දෙපැත්තම මුද්‍රිත** සහතික කරන ලද ඡායා පිටපත් කොළයක් සඳහා රු. 12.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.6.00 ක මුදලක් හා ඉතිරි රු.6.00 න් 70% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 30%ට අදාළ මුදල පහත සඳහන් පරිදි බෙදා ගෙවීම් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| I. | පිටපත් ලබා ගන්නා නිලධාරියාට | 20% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 10% |

1.2 ඡායා පිටපත් නිකුත් කිරීමේ යන්ත්‍ර(Photo copy machine) මගින් ලබා ගෙන නිකුත් කරනු ලබන **එක් පැත්තක් පමණක් මුද්‍රිත** සහතික කරන ලද ඡායා පිටපත් කොළයක් සඳහා රු. 8.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.5.00 ක මුදලක් හා ඉතිරි රු.3.00 න් 70% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 30%ට අදාළ මුදල පහත සඳහන් පරිදි බෙදා ගෙවීම් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| I. | පිටපත් ලබා ගන්නා නිලධාරියාට | 20% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 10% |

1.3 ඉදිරිපත් කරනු ලබන පිටපත් සහතික කිරීමේදී **දෙපැත්තම මුද්‍රිත** කොළයක් සඳහා රු. 7.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.1.00 ක මුදලක් හා ඉතිරි රු.6.00 න් 50% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 50% ට අදාළ මුදල පහත සඳහන් පරිදි බෙදා ගෙවීම් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| I. | සැසඳුම් කරන නිලධාරියාට | 25% |
| II. | සහතික කරන නිලධාරියාට | 25% |

1.4 ඉදිරිපත් කරනු ලබන පිටපත් සහතික කිරීමේදී **එක් පැත්තක් පමණක් මුද්‍රිත කොළයක්** සඳහා රු. 4.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.1.00 ක මුදලක් හා ඉතිරි රු.3.00 න් 50% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 50% ට අදාළ මුදල පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | සැසඳුම් කරන නිලධාරියාට | 25% |
| II. | සහතික කරන නිලධාරියාට | 25% |

1.5 පරිගණකයක හෝ වෙනත් ගබඩා කිරීමේ උපාංගයක(Storage Device) ගබඩා කර තිබූ යතුරු ලියනය කරන ලද ලේඛණයක දෙපැත්තම මුද්‍රිත කොලයක මුද්‍රිත පිටපතක් සඳහා රු. 17.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එක් පැත්තක් පමණක් මුද්‍රිත කොළයක් සඳහා රු. 12.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. මෙලෙස අය කරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | පිටපත් ලබා ගන්නා නිලධාරියාට | 7 % |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 3 % |
| III. | රජයේ ගාස්තුව | 90 % |

## 02. <u>පිටපත් යතුරුලියනය කිරීමේ හා සහතික කිරීමේ ගාස්තු</u>

යතුරුලියනය කිරීමේ යන්ත්‍ර හෝ පරිගණක යන්ත්‍ර මගින් යතුරු ලියනය කර නිකුත් කරනු ලබන සහතික පිටපත් සඳහා පහත පරිදි ගාස්තු අයකළ යුතුය.

2.1 යතුරු ලියන පේළි 25 ට වැඩි පිටුවක් සඳහා රු. 30.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.12.00 ක මුදලක් හා ඉතිරි රු.18.00 න් 20% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි මුදල පහත සඳහන් පරිදි බෙදා ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 50% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 30% |

2.2 යතුරු ලියන පේළි 15 සිට 25 දක්වා රු. 25.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.13.00 ක මුදලක් හා ඉතිරි රු.12.00 න් 20% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි මුදල පහත සඳහන් පරිදි බෙදා ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 50% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 30% |

2.3 යතුරු ලියන පේළි 15 ට අඩු පිටුවක් සඳහා රු. 22.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.14.00 ක මුදලක් හා ඉතිරි රු.8.00 න් 20% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි මුදල පහත සඳහන් පරිදි බෙදා ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 50% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 30% |

## 03. <u>කාබන් පිටපත් නිකුත් කිරීමේ ගාස්තු</u>

කාබන් පිටපත් මගින් සහතික පිටපත් නිකුත් කිරීමේදී පහත පරිදි ගාස්තු අයකළ යුතුය.

3.1 පේළි 25 ට වැඩි පිටුවක් සඳහා රු. 13.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.6 ක මුදලක් හා ඉතිරි රු.7.00 න් 50% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 50%ක ප්‍රතිශතය යතුරු ලියන නිලධාරියාට ලබා දිය යුතුය.

3.2 පේළි 15 සිට 25 දක්වා රු. 12.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.7.00 ක මුදලක් හා ඉතිරි රු.5.00 න් 50% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 50%ක ප්‍රතිශතය යතුරු ලියන නිලධාරියාට ලබා දිය යුතුය.

3.3 පේළි 15 ට අඩු පිටුවක් සඳහා රු. 11.00 ක ගාස්තුවක් අයකළ යුතු වේ. එම මුදලින් රු.8.00 ක මුදලක් හා ඉතිරි රු.3.00 න් 50% ක ප්‍රතිශතයක් රජයේ ආදායමට බැර කළ යුතු අතර ඉතිරි 50%ක ප්‍රතිශතය යතුරු ලියන නිලධාරියාට ලබා දිය යුතුය.

4.1 පරිගණක යන්ත්‍ර හෝ යතුරු ලියන යන්ත්‍ර භාවිතයෙන් යතුරු ලියනය කර සහතික පිටපත් නිකුත් කිරීමේදී ඉහත අංක 02 ඡේදය පරිදි ගාස්තු අයකළ යුතු අතර, එහිදී අදාළ පිටපත ලබා දීම වෙනුවෙන්ම එම ලේඛනය යතුරු ලියනය කර ඇති බව අදාළ වවුචර්පත් අනුමත කරන නිලධාරියා විසින් පෞද්ගලිකව සෑහීමට පත්විය යුතුය.

4.2 සහතික පිටපත් ලෙස ඉල්ලා සිටිය හැකි ලේඛනවල මෘදු පිටපතක්(Soft Copy) නිසි පරිදි සුරක්ෂිතව ගබඩා කොට පවත්වා ගෙන යාම එම ලේඛන යතුරු ලියනය කරන නිලධාරීන්ගේ වගකීමකි.

4.3 ගබඩා කර ඇති මෘදු පිටපතකින් මුද්‍රිත පිටපතක් ගැනීමට නොහැකි තත්වයට පත්වීම නිසා හෝ දෘඩ පිටපතකින්(Hard Copy) ඡායා පිටපතක් ලබා ගැනීමට නොහැකි වීම නිසා හෝ සහතික පිටපත් නිකුත් කිරීමේ කාර්යයට පමණක් එය යළි යතුරු ලියනය කිරීමට සිදු වන්නේ නම් ඒ සඳහා ආයතන ප්‍රධානියාගේ හෝ ඒ සඳහා ආයතන ප්‍රධානියා විසින් විධිමත්ව බලය පැවරූ නිලධාරියෙකුගේ අනුමැතිය ලබා ගත යුතුවේ.

4.4 එක් වරක් යතුරු ලියනය කරන ලද ලේඛන සහතික පිටපත් ලබා දීමේ කාර්යය සඳහාම නැවත නැවත යතුරු ලියනය කිරීම අවම කර ගැනීමට නිසි පරිදි අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කර අධීක්ෂණය කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ.

අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 02/2023 හි 01, 02, 03 හා 04 වගන්ති හැරුණු කොට එම චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් ඒ ආකාරයෙන්ම බලපැවැත්වෙන අතර එම චක්‍රලේඛයට අනුව මෙතෙක් සිදු කරන ලද අයකිරීම් වලට අගතියක් නොවන පරිදි මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් 2023.09.15 දින සිට බලපැවැත්වෙනු ඇත.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත් :
1. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය